**ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
-----------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**1.1 මතය**
--------

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2022 ජූනි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
-----------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑමප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.2.1 (අ) | කොමිෂන් සභාව සතු සියළු වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් 2004 ජනවාරි 01 දිනෙන් පසු අත්පත් කර ගත් වත්කම් පමණක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණු අතර 2004 වර්ෂයට පෙර පැවති වත්කම් ඇතුළත් කර නොතිබුණි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය<br>නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>(i) 3.2 ඡේදය | සෑම මුදල් වර්ෂයකම ජුනි 15 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරිටද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2020 වර්ෂය සඳහා වූ වාර්තාවෙන් කොටසක් මාස 06 ක පමණ ප්‍රමාදයක් සහිතව 2021 දෙසැම්බර් මසදී විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවේ අම්පාර, බදුල්ල, කල්මුනේ, මහනුවර යන ප්‍රාදේශීය කාර්යාලවල හා නුවරඑළිය, කිලිනොච්චිය, මන්නාරම, පොළොන්නරුව යන උපකාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඇතුළත් වී නොතිබුණි. | 2021 වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල සියල්ල භාණ්ඩ සමීක්ෂණය අවසන් කර වාර්තා මේ සමඟ ඉදිරිපත් කරන අතර ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) 3.2.5ඡේදය | උක්ත චක්‍රලේඛයේ ප්‍රකාරව සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට පෙර පොදු 47වාර්තාව අනුව විනාශ කළ යුතු,අලුත්වැඩියා කළ යුතු , විකිණිය යුතු හා වෙනත් ආයතන වලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවත් එලෙස කටයුතු කිරීමකින් තොරව පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර තිබුණි. | 2020 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ පොදු 47 න් ඉවත් කිරීම සඳහා යෝජිත භාණ්ඩ පුත්තලම ගොවිජන සේවා කාර්යාලය වෙත මාරු කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකළ යුතු වේ. |
| (ආ) 1993 සැප්තැම්බර් 21දිනැති 22/93 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජකාරියේ යෙදී සිටියදී 2014 වර්ෂයේදී අනතුරකට ලක්වූ කොමිෂන් සභාවේ නිලධාරිනියකට චක්‍රලේඛය ප්‍රකාරව ගෙවූ රු.308,700 ක වන්දි මුදලට අමතරව කොමිෂන් සභාවේ අනුමැතිය මත පමණක් 2016 අප්‍රේල් මාසයේ සිට 2019 මාර්තු මාසය දක්වා මාසික ප්‍රවාහන දීමනා ලෙස එකතුව රු.650,016 ක් ගෙවා තිබුණි. | 2016 සිට රාජකාරි සඳහා වාර්තා කළ යුතු බැවින්ද ඇය කාර්යාලයට ගෙන්වා ගැනීම අත්‍යවශ්‍ය වූ බැවින්ද ඇයගේ ආබාධිත තත්ත්වය වරින් වර සැත්කම් වලට භාජනය වූ බැවින් ද කොමිෂන් සභා තීරණයක් මත ප්‍රවාහන දීමනාවක් ඇය වෙත ගෙවා ඇත. එම මුදල රු.650,016 ක් වුවද මාසිකව වැය කර ඇති මුදල රු.2313 කි. | චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල සීමාව තුල අධ්‍යාපන අමාත්‍යාංශයට,විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා පොලිසියට | කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොවීම පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් ඒ සඳහා පරීක්ෂණ හා | ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කළ |

| | | | |
|---|---|---|---|
| | අදාලව ලබා දී තිබුණු නිර්දේශ 147 න් විගණිත දිනය වන 2022 පෙබරවාරි 14 දින වන විට ක්‍රියාත්මක වී තිබුණේ ලබාදුන් නිර්දේශ වලින් සියයට 44 ක් එනම් නිර්දේශ 64 ක් පමණි. | විමර්ශන අංශය විසින් වෙනම ඒකකයක් පිහිටුවා නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කරමින් පවතී. | යුතු වේ. |
| (ආ) | මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020 හා 2021 වර්ෂවල පොලිස් ස්ථාන, රැඳවුම් මධ්‍යස්ථාන හා බන්ධනාගාර නිරීක්ෂණය කර විමර්ශණ නිලධාරියා ඒ පිළිබඳ සකස් කරන වාර්තාවල සඳහන් කළ යුතු වැදගත්ම කරුණු ලෙස දක්වා ඇති ස්ථාන නිරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු, ඒ සම්බන්ධයෙන් තමාගේ නිගමනයන් හා ගනු ලැබූ පියවරයන් කවරේද යන්න ඇතුළත් කර නොතිබුණි. තවද එම වාර්තාව කවරෙකු වෙත යොමු කරන්නේද යන්න සඳහන්ව නොතිබුණු අතර එම වාර්තාව වෙනත් නිලධාරියකු විසින් පසු විපරම් කරන බවට සාක්ෂි නොවීය. | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොවීම පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් ඒ සඳහා පරීක්ෂණ හා විමර්ශන අංශය විසින් වෙනම ඒකකයක් පිහිටුවා නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කරමින් පවතී. | පොලිස් ස්ථාන, රැඳවුම් මධ්‍යස්ථාන හා බන්ධනාගාර නිරීක්ෂණය කර විමර්ශණ නිලධාරියා විසින් සකස් කරන වාර්තාවේ එම ස්ථාන නිරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු හා ඒ සම්බන්ධයෙන් තමාගේ නිගමනයන්ද, ගනු ලැබූ පියවරයන් කවරේද යන්නද ඇතුළත් කළ යුතු වේ. |
| (ඇ) | අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණද ඒ තුලින් මහජනයාගේ දැනුවත් භාවය වැඩිවීමක් සිදුවී නොතිබීම නිසා මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත පසු ගිය වර්ෂ 05 තුල ලැබුණු පැමිණිලි වලින් නිර්දේශ ලබා දීමෙන් හා සහන ලබා දීමෙන් තොරව සියයට 67 ත් සියයට 95 ත් අතර පැමිණිලි ප්‍රමාණයක් විවිධ හේතූන් දක්වා ඉවත් කර තිබුණු අතර සියයට 40 කට අධික පැමිණිලි ප්‍රමාණයක් මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදුවී නොතිබීම හෝ විෂය පථයට අනුකූල නොවීම මතඉවත් කර තිබුණි. | මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් දකුණු පළාතේ ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුන ආවරණය කරයි. මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් පසුගිය වසර 5 තුල අධ්‍යාපන වැඩසටහන් 108 ක් පමණ සිදු කර ඇත. එමගින් ප්‍රදේශයේ ජනතාවට මානව හිමිකම් පිළිබඳව දැනුවත් කිරීම සිදු කර ඇත. මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් විශාල ප්‍රදේශයක් ආවරණය වන අතර එම ප්‍රදේශය තුල විශාල ජනතාවක් ජීවත් වේ. | මහජනයාගේ දැනුවත් භාවය වැඩි වන ලෙසඅධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මකකළ යුතු වේ. |
| (ඈ) | මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් පැමිණිලි විමර්ශනය කිරීමේදී වර්ෂ 02 ත් වර්ෂ 08 ත් අතර විශාල කාල පමාවක් පැවති අතර වර්ෂය තුල ලැබුණු පැමිණිලි සඳහා එම වර්ෂය තුලදීම නිර්දේශ ලබාදී තිබුණේ සියයට 01 කටත් අඩු ප්‍රමාණයක් සඳහා පමණි. | ප්‍රාදේශීය කාර්යාල වල පැමිණිලි විමර්ශනයට හා නිර්දේශ ලබා දීම සඳහා කඩිනම් පියවර ගැනීම සඳහා උපදෙස් දී ඇත. | පැමිණිලි විමර්ශන කටයුතු කඩිනම් කළ යුතු වේ. |

## 3.2 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ පැවති කාන්තා දින සැමරුම් වැඩ සටහනේ ඡායාරූප හා වීඩියෝ ගත කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත වීමකින් තොරව කිසිදු මිල කැඳවීමක් සිදු නොකර පෞද්ගලික ආයතනයක් මඟින් සිදු කර ඒ සඳහා රු.30,000 ක් ගෙවා තිබුණි. | 2021 වර්ෂයේ ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වන ලද සම්මන්ත්‍රණය සඳහා වැඩ සටහන් ඡායාරූප හා වීඩියෝ ගත කිරීම මීට පෙර කරන ලද වැඩසටහන් වලට නිතරම සම්බන්ධවන ආයතනයකින් වාචික මිල ගණන් විමසා එම මිළ ගණන් සඳහා විධිමත් අනුමැතිය මඟින් රජයට පාඩුවක් සිදු නොවන ආකාරයෙන් හා උපරිම සේවය ලබා ගැනීම සඳහා සිදුකර ඇත. ඉදිරියට මෙවැනි අඩු පාඩු මග හරවා ගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුගත වෙමින් රාජකාරි සිදු කරන ලෙස සියලුම නිලධාරීන් දැනුවත් කරන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත විය යුතු වේ. |
| (ආ) කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ පැවති කාන්තා දින සැමරුම් උළෙල පැවැත්වීම සඳහා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව තෝරාගෙන තිබුණි. මෙහිදී ආහාර පාන මිලදී ගැනීමට අදාල ලංසු කැඳවා නොතිබූ අතර ශාලා පහසුකම් සඳහා පමණක් ලංසු කැඳවීම සිදු කර තිබුණි. | 2021 කාන්තා දින සැමරුම සඳහා ආයතන 4කින් මිල ගණන් කැඳවා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව තෝරාගත් අතර, එම ආයතනය විසින් ආහාර සැපයීම ද සිදු කරන ලදි. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව වෙනත් කිසිම ආයතනයකින් හෝ බාහිර පුද්ගලයෙකුගෙන් ආහාර ලබා ගැනීමට අවස්ථාව ලබා නොදෙයි. එබැවින් ආහාර ලබා ගැනීමට මිල ගණන් කැඳවීමක් සිදු කිරීමේ අවස්ථාවක් නොමැති බැවින් අදාල ආයතනයෙන්ම ආහාර ලබා ගැනීම සිදු කරන ලදි. | ලංසු කැඳවීමේදී ශාලා පහසුකම් සඳහා පමණක් නොව ආහාර සැපයීමද ඇතුළත්ව ලංසු කැඳවීම සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රු.600,000 ක්වූ ලැප්ටොප් පරිගණක මිලදීගැනීමේ ප්‍රසම්පාදනයේදී ඒ සඳහා වූ තාක්ෂණික පිරිවිතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) (ii) ඡේදය අනුගමනය නොකර තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිගේ අත්සනින් පමණක් අනුමැතිය ලබාදී තිබුණි. | තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත පිරිවිතරයන් හා මිලගණන් ලබා දෙමින් තාක්ෂණ ඇගයීම් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි.මෙම කාලය තුල කොවිඩ් 19 වසංගතය බරපතල ලෙස පැවති කාලයක් වූ බැවින්, සභාපති විසින් කමිටු සාමාජිකයන් සමග දුරකථනයෙන් සාකච්ඡා කරමින් වාචික එකගතාවයන් මත සභාපති විසින් සකස් කරන ලද වාර්තාවට අදාල සාමාජිකයන් විසින් ලබාදෙන ලද එකඟතාවය මත තීරණය ලබාගෙන එම තීරණය සභාපති විසින් පමණක් අත්සන් කර ඉදිරිපත් කිරීම පිළිගෙන ඇත. කෙසේ වෙතත් මෙවැනි අඩු පාඩු අවම කරගෙන රාජකාරි ඉටුකිරීමේදී අවශ්‍ය නිවරදි පියවර ගන්නා ලෙසත් සියළුම නිලධාරීන් දැනුවත්කරන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශව ලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කළ යුතු අතර, එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කළ යුතුය. එසේ වුවත් ලැප්ටොප් පරිගණක මිලදීගැනීමේ ප්‍රසම්පාදනයේදී එලෙස ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම සඳහා සියළුම සාමාජිකයින් අත්සන් කල යුතු වුවද කොවිඩ් 19 අවස්ථාවේ මෙසේ සිදු කිරීමට නොහැකි වූ අතර, දැනට ලංසු විවෘත කිරීමේ අඩුපාඩු යාවත් කාලීන කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශව ලට අනුව කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------ | ----------- |
| (අ) | පසුගිය වර්ෂයේ සිට ධාවනයෙන් තොරව පරිශ්‍රයේ ගාල් කර පැවති යතුරු පැදි 03 ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ වෙනත් ආයතනයකට පවරා දීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | බයිසිකල් 03 රාජකාරී අවශ්‍යතාවයන් මත වෙන් කිරීම සඳහා පියවර ගනිමින් පවතී. | යතුරුපැදි සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නිලධාරිනියකු අතින් හානියට පත්වූ ලැප්ටොප් පරිගණකය නැවත යථා තත්ත්වයට පත්කිරීමට වැයවූ රු. 80,000 ක මුදල එම නිලධාරිනියගෙන් අය කර ගැනීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි. | හානියට පත්වූ ලැප්ටොප් පරිගණක යන්ත්‍රය අලුත්වැඩියා සඳහා දැරීමට සිදු වූ රු 80,000 ක මුදල පරිගණකය පාවිච්චි කරන ලද නිලධාරියාට ගෙවන ලෙස දන්වා ඇත. ඇය විසින් මේ සඳහා අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, එම අභියාචනය සඳහා ඉදිරිපත් කළ මාණ්ඩලික තීරණය ලැබු වහාම අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට සටහන් කරගෙන ඇත. | රු.80,000 අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල විසින් මාසික වැඩ සැලසුම් සකස් කර ඒවා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු අතර මාසය අවසානයේ එම සැලසුම්ගත කාර්යන් ඉටු කිරීම පිළිබඳව ප්‍රගති වාර්තාවක් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020 හා 2021 වර්ෂවල එලෙස කටයුතු කර නොතිබුණි. | ප්‍රගති වාර්තාවන් නිසි පරිදි ඉදිරිපත් වන්නේද යන්න පිළිබඳ පසු විපරම් කිරීම ප්‍රධාන කාර්යාලය විසින් කළ යුතු වුවද එම පසු විපරම එසේ සිදු නොවීමේ අඩුපාඩුව පිළිගන්නා අතර, ඉදිරියේදී එම අඩුපාඩු මග හරවා ගෙන කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් දී ඇති අතර, ඉදිරියේදී එම අඩුපාඩුව මඟහරවා කටයුතු කිරීමට එකඟ වෙමි. | ප්‍රාදේශීය කාර්යාල විසින් මාසික වැඩ සැලසුම් සහ මාසය අවසානයේ ඒ පිළිබඳව ප්‍රගති වාර්තාවක් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2017 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණකවරයකු පත් කර අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත් කර ගැනීමට ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. කොමිෂමේ රාජකාරි සඳහා සුදුසු නිලධාරියක් නොසිටිය බැවින් බඳවා ගැනීම ප්‍රමාද විය. දැනට බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් මේ සඳහා නිලධාරියකු පත් කර ගැනීම ගැටළු සහගත බවට පත්වී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කළ යුතු වීම. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, 2017 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයකු නොමැති බැවින් විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු ලේකම්වරිය 2018 ජනවාරි 30 වන දින අනිවාර්ය නිවාඩු යවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදු කළ | රට තුල කොවිඩ් 19 වසංගතය හමුවේ සාක්ෂිකරුවන් සාක්ෂි සඳහා කැඳවීමේ අපහසුතාවයක්ද පරීක්ෂණ දිගින් දිගටම කල් දැමීම මත කාලය දිග් | විධිමත් විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | මූලික විමර්ශනයේ වාර්තාව පදනම් කර ගනිමින් 2019 නොවැම්බර් 21 දින ලේකම්වරියගේ වැඩ තහනම් කර තිබුණි.කොමිෂන් සභාව විසින් 2020වර්ෂයේ ඒ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබුණු නමුත් විගණන දිනය වන විට වර්ෂ 2ක් පමණ කාලයක් ගත වී තිබුණද විනය පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | ගැස්සී ඇත.මෙම පරීක්ෂණය අවසන් කර වාර්තාව ලබා දෙන ලෙස දක්වා ඇති අතර, මාස 03 ක් ඇතුළත අවසන් කරන බවට දැනට තහවුරුවක් ලබාදී ඇත. | |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 235 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 144 ක් විය. නිලධාරීන් 93 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21 ක්ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 37 ක්ද හා ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 35 ක්ද විය. ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකු අතිරික්තව පැවතුනි. ඒ අනුව කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 40 ක් පුරප්පාඩුව පැවතුනි. | මෙම පුරප්පාඩු වූ තනතුරු වලින් තනතුරු 63 ක් සඳහා අයදුම්පත් කැඳවා ඇත. රජයේ ප්‍රතිපත්තිමය හේතූන් මත බඳවා ගැනීම් අත්හිටුවා ඇත. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 46 ක් වු අතර තත්‍ය කාර්ය මණ්ඩලය 25 ක් විය. ඉන් එක් නිලධාරියකු ද්විතීයීය පදනම මතද තවත් නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මතද පුරවා තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 24 ක් පුරවා නොතිබුණි. | මෙම පුරප්පාඩු වූ තනතුරු වලින් තනතුරු 63 ක් සඳහා අයදුම්පත් කැඳවා ඇත. රජයේ ප්‍රතිපත්තිමය හේතූන් මත බඳවා ගැනීම් අත්හිටුවා ඇත. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |